# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 157 — 1975 මාර්තු 27 වැනි බ්‍රහස්පතින්ද — 1975.03.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකමම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | 61 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... ... | 68 |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | 62 | | |


**සැළකිය යුතුයි.**—(i) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 11 දරන පශු වෛද්‍ය හා පශු වෛද්‍ය වෘත්තික (සංශෝධන) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 12 දරන මෝටර් වාහන (සංශෝධන) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 15 දරන සිරි අනුරාධපුර බැස්වියන් විශ්‍රාම ශාලා පාලක සමිතිය පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 16 දරන දෙව් සුව සේවාව (සංස්ථාගත කිරීම) පනත 1975 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ වේ. (ii) ජාතික මිල කොමිෂන් සභා පනත් කෙටුම්පත 1975 මාර්තු මස 14 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාල සියළුම ලියුම් කියුම් කොළඹ 1, ඇව්ලන් වකුරග්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ සෑම ක්‍රියාකාරී දිනකම පෙරවරු නවයේ සිට පස්වරු තුන දක්වා ද, ශල්බන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරී දිනවල පස්වරු දෙක දක්වා භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියා පදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම්

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් වෙළෙඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බවට සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්යාලීය අංකය සමඟ දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1974 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

**විරෝධය දැක්වීම**

**පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළතදී රුපියල් 25ක අවලංගු නොකරන ලද හෝ ලාංජිත මුද්දරයක්ද සමඟ ටී. ඇම්. 7 දරන පෝරම මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාල සීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.**

**ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නොකළ හැකිය.**

**විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සලකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්ය නැතැර හැර කිරීම ද සැළකිල්ලට ගනු ලැබේ.**

---

**ශුද්ධියකි**

අංක 87 හා 1973 නොවැම්බර් මස 23 වැනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 32368 දරණ 38 වෙනි පන්තියේ වෙළඳ ලකුණු සම්බන්ධ නිවේදනයේ අංක (7) යටතේ පහත සඳහන් කරුණු ද අඩංගු විය යුතුය.

(අ) " අයි. එච්. යන අක්ෂර සඳහාත් ලංකා යන වචනය සඳහාත් විස්තරාත්මක වචන සඳහාත් තනි අයිතිය නොලැබේ.

(ආ) වෙ. ල. අංක 5613 අයිතිකරුවන් වෙත ගැසට් නිවේදනයේ පිටපතක් යැවිම් කළ යුතුය. මෙම වෙළඳ ලකුණ පළකරන ලද ගැසට් පත්‍රයේ එම නිවේදනයේ පිටපතක් නම් කරන ලද අංක 5613 දරණ වෙළඳ ලකුණ අයිතිකරුවන් වෙත භාරදීමේ කොන්දේසියට යටත්ව මෙම ලකුණ පිළිගන්නා ලදී.

ජේ. ඇලන් අයි. විජයකෝන්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

1974 අගෝස්තු 19 වැනිදා,
කොළඹ 1, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේදිය.

3–576—75.03.27 දින අංක 157 දරණ ගැසට් පත්‍රය

---

# පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන

**ඇන්වීම**

පහත සඳහන් පිරිවිතරය පිළිගෙන ඇත :—

1969 ජනවාරි 27 දිනැති අංක 6299 (46 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කළ 1965 ඔක්තෝබර් 11 දිනැති එක්සත් රාජධානියේ පේටන්ට් අංක 1,051,375) සීමාසහිත ඉම්පීරියල් කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් " හැලොතේන් පිරිසිදුකිරීම ".

උධෘතය :

නිෂ්පාදනයේ ස්වභාවය පහත දැක්වෙන ඉල්ලුම් පත්‍රිකා 1 න් නිශ්චය කර ගත හැක.

1. පහත සූත්‍රයේ දැක්වෙන සංයෝග එකක් හෝ වැඩි ගණනක් අප ද්‍රව්‍ය ලෙස අඩංගු අපිරිසිදු හැලොතේන් පිරිසිදු කිරීමේ ක්‍රමයෙකි.

$$CF_3CX{=}cyc\ F_3$$

මෙහි X වලින් දැක්වෙන්නේ හයිඩ්‍රජන් බ්‍රෝමීන් හෝ ක්ලෝරීන් වේ. y වලින් දැක්වෙන බ්‍රෝමීන් හෝ ක්ලෝරීන් ඉහත කී අපිරිසිදු හැලොතේන් ද්‍රව අවස්ථාවේ ඇලුමිනියම් ක්ලෝරයිඩ් ඇලුමිනියම් බ්‍රෝමයිඩ් හෝ ඇන්ටිමනි පෙන්ට ක්ලෝරයිඩ් සමඟ සම්පව ස්පර්ශ වී පවතී.

මෙහි ඉල්ලුම් පත්‍රිකා 9 ක් හා උදාහරණ 6 කි.

ආර්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

1973 මාර්තු 11 වැනිදා,
කොළඹ දී.

3–219/1—75.03.27 දින අංක 157 දරණ ගැසට් පත්‍රය

---

**ඇන්වීම**


පහත සඳහන් පිරිවිතරය පිළිගෙන ඇත :—

1969 ජනවාරි 22 දිනැති අංක 6295 (1962 අප්‍රේල් 27 දින 46 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කළ එක්සත් රාජධානියේ පේටන්ට් අංක 974366) ස්ටෝෆර් කෙමිකල් සමාගම.

" නයිට්‍රජන් අඩංගු මහටරෝසයික් ලික් කාබොනයෝලේට් වල් පැලෑටි නාශක ".

උධෘතය :—

නිෂ්පාදනය, වල් පැලෑටි මර්ධනය කිරීමේ ක්‍රමයක් හා සම්බන්ධ වූවකි. මෙම ක්‍රමයේ දී පහත දී ඇති පොදු සූත්‍රයේ පෙන්වා ඇති සංයෝගයේ පැලෑටිවලට විෂ වූ ප්‍රමාණයක් පොළවට යොදනු ලැබේ.



මෙහි R යනු කාබන් පරමාණු 1 සිට 5 දක්වා වූ ප්‍රමාණයක් අඩංගු ඇල්කිල් ඛණ්ඩයකි. මෙහි ඉල්ලුම් පත්‍රිකා 11 ක් හා උදාහරණ 8 කි.

පී. එෆ්. තම්බරාජන්,
වැ. බ. පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

1973 අප්‍රේල් 26 දින,
කොළඹ දී.

3–219/2—75.03.27 දින අංක 157 දරණ ගැසට් පත්‍රය

---

**ඇන්වීම**

පහත සඳහන් පිරිවිතරය පිළිගෙන ඇත :—


1969 ජනවාරි 23 දිනැති අංක 6294 (ප්‍රමුඛත්ව දින 1968 ජනවාරි 22 දින ඉල්ලා ඉදිරිපත් කරන ලද ඇ.ජ. ආර්. ජර්මණියේ අංක 1668899.6)

**FARBWERKE HOECHST AKTIENGESELLSCHAFT VORMALS MEISTER LUCIUS & BRUNING**

" පිරාන් කාබොක්සිලික් අම්ල ඇනිලිඩ හා පලිබෝධ නාශක විශයෙන් ඒවායේ පාවිච්චිය ".

උධෘතය :—

නිෂ්පාදනය සම්බන්ධ වන්නේ පහත පෙන්වා ඇති පොදු සූත්‍රයේ සඳහන් 2-මෙතිල්-5, 6-ඩයිහයිඩ්රොපිරාන්-3 කාබොක්සිලික් අම්ල ඇනිලයිඩ අඩංගු ශාක ඇරක්ෂාකාරී කාරක පිළිබඳවයි.



මෙහි R වලින් දක්වන්නේ හයිඩ්‍රජන්, මෙතිල් ඛණ්ඩයක් හෝ මෙතොක්සි ඛණ්ඩයක් වියුත්පන්න බෙන්සීන් න්‍යෂ්ටියේ මෙටා, ඕතෝ, හෝ පැරා ස්ථානයේ පිහිටයි.

මෙහි ඉල්ලුම් පත්‍රිකා 17 ක් හා උදාහරණ 12 කි.

පී. එෆ්. තම්බරාජන්,
වැ. බ. පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

1973 අප්‍රේල් 24 වැනිදා,
කොළඹ දී ය.

3–219/3—75.03.27 දින අංක 157 දරණ ගැසට් පත්‍රය

# මෝස්තර ආඥාපනත යටතේ නිවේදන

## මෝස්තර ආඥාපනත (153 පරිච්ඡේදය)

මෝස්තර ආඥාපනතේ (153 පරිච්ඡේදය) 32 වෙනි වගන්තිය යටතේ සම්පාදිත මෝස්තර ව්‍යවස්ථාවල 10 වෙනි ව්‍යවස්ථාවට අනුකූලව එංගලන්තයේ වෙස්ටර් කවුන්ටියේ පෝර්ට් සන්ලයිට් හි යුනිලිවර් ලිමිටඩ් නමින් වූ 12 වෙනි පන්තියට අයත්වන අංක: ඞී 1405 දරණ මෝස්තරයේ ප්‍රකාශණ අයිතිය 1975 ජනවාරි මස 6 වෙනි දින සිට අවුරුදු පහකට තුන්වෙනි වරටත් දීර්ඝ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. අයි. විජයකෝන්,
මෝස්තර රෙජිස්ට්‍රාර්.

කොළඹ,
1975 ජනවාරි මස 31 දින.

9-503—75.03.27 දින අංක 157 දරණ ගැසට් පත්‍රය

---

## මෝස්තර ආඥාපනත (153 පරිච්ඡේදය)

මෝස්තර ආඥාපනතේ (153 පරිච්ඡේදය) 32 වෙනි වගන්තිය යටතේ සම්පාදිත මෝස්තර ව්‍යවස්ථාවල 10 වෙනි ව්‍යවස්ථාවට අනුකූලව එංගලන්තයේ වෙස්ටර් කවුන්ටියේ පෝර්ට් සන්ලයිට්හි බ්‍රිතාන්‍ය සමාගමක් වන යුනිලිවර් නමින් වූ 12 වෙනි පන්තියට අයත්වන අංක: ඞී 1393 දරණ මෝස්තරයේ ප්‍රකාශණ අයිතිය 1974 ජූනි මස 23 වෙනි දින සිට අවුරුදු පහකට තුන්වෙනි වරටත් දීර්ඝ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. අයි. විජයකෝන්,
මෝස්තර රෙජිස්ට්‍රාර්.

කොළඹ,
1975 ජනවාරි මස 31 දින.

9-502—75.03.27 දින අංක 157 දරණ ගැසට් පත්‍රය

## මෝස්තර ආඥාපනත (153 පරිච්ඡේදය)

මෝස්තර ආඥාපනතේ (153 පරිච්ඡේදය) 32 වෙනි වගන්තිය යටතේ සම්පාදිත මෝස්තර ව්‍යවස්ථාවල 10 වෙනි ව්‍යවස්ථාවට අනුකූලව එංගලන්තයේ වෙස්ටර් විරල් පෝර්ට් සන්ලයිට් හි යුනිලිවර් ලිමිටඩ් නමින් වූ 4 වෙනි පන්තියට අයත්වන අංක: ඞී 1453 දරණ මෝස්තරයේ ප්‍රකාශණ අයිතිය 1974 අගෝස්තු මස 22 වෙනි දින සිට අවුරුදු පහකට දෙවෙනි වරටත් දීර්ඝ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. අයි. විජයකෝන්,
මෝස්තර රෙජිස්ට්‍රාර්.

කොළඹ,
1975 ජනවාරි මස 31 දින.

9-498—75.03.27 දින අංක 157 දරණ ගැසට් පත්‍රය

---

## මෝස්තර ආඥාපනත (153 පරිච්ඡේදය)

මෝස්තර ආඥාපනතේ (153 පරිච්ඡේදය) 32 වෙනි වගන්තිය යටතේ සම්පාදිත මෝස්තර ව්‍යවස්ථාවල 10 වෙනි ව්‍යවස්ථාවට අනුකූලව එංගලන්තයේ වෙස්ටර් විරල් පෝර්ට් සන්ලයිට් හි යුනිලිවර් ලිමිටඩ් නමින් වූ 3 වෙනි පන්තියට අයත්වන අංක: ඞී 1455 දරණ මෝස්තරයේ ප්‍රකාශණ අයිතිය 1974 අගෝස්තු මස 22 වෙනි දින සිට අවුරුදු පහකට දෙවෙනි වරටත් දීර්ඝ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. අයි. විජයකෝන්,
මෝස්තර රෙජිස්ට්‍රාර්.

කොළඹ,
1975 ජනවාරි මස 31 දින.

9-484—75.03.27 දින අංක 157 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වෙනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

### 1975

| මාසය | | පළ කිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| මාර්තු | ... | 07.03.75 | සිකුරාද | ... | 82.02.75 | සිකුරාද | දවල් 12.00 |
| | | 14.03.75 | සිකුරාද | ... | 07.03.75 | සිකුරාද | දවල් 12.00 |
| | | 21.03.75 | සිකුරාද | ... | 14.03.75 | සිකුරාද | දවල් 12.00 |
| | | 27.03.75 | බ්‍රහස්පතින්ද | ... | 21.03.75 | සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් | ... | 04.04.75 | සිකුරාද | ... | 27.03.75 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | | 11.04.75 | සිකුරාද | ... | 04.04.75 | සිකුරාද | දවල් 12.00 |
| | | 18.04.75 | සිකුරාද | ... | 11.04.75 | සිකුරාද | දවල් 12.00 |
| | | 24.04.75 | බ්‍රහස්පතින්ද | ... | 18.04.75 | සිකුරාද | දවල් 12.00 |
| මැයි | ... | 02.05.75 | සිකුරාද | ... | 24.04.75 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | | 09.05.75 | සිකුරාද | ... | 02 05.75 | සිකුරාද | දවල් 12.00 |
| | | 16.05.75 | සිකුරාද | ... | 09.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | | 23.05.75 | සිකුරාද | ... | 16.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | | 30.05.75 | සිකුරාද | ... | 23.05.75 | සිකුරාද | දවල් 12.00 |
| ජූනි | ... | 06.06.75 | සිකුරාද | ... | 30.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | | 13.06.75 | සිකුරාද | ... | 06.06.75 | සිකුරාද | දවල් 12.00 |
| | | 20.06.75 | සිකුරාද | ... | 13.06.75 | සිකුරාද | දවල් 12.00 |
| | | 27.06.75 | සිකුරාද | ... | 20.06.75 | සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී